අද
2023-12-05
අඟහරුවාදා
012 / 239
RS.40/=
city edition

## සුමින්ද සිරිසේන දිවියෙන් සමුගනී
>>P2



## කැලණිය සරසවිය දින නියමයක් නැතිව වැසෙයි

ආරක්ෂක නිලධාරියෙකු පැහැරගෙන ගොස් රඳවාගෙන පහරදී ගේට්ටුවේ ගැටගැසීමේ සිද්ධියක් දුර දිග යයි

අද උදෑසන 8ට පෙර නේවාසිකාගාරවලින් සියලු සිසුන් ඉවත්විය යුතු බවටත් නියෝග
>>P6




# දියණිය බේරාගැනීමට බිරිඳ සිය සැමියා ඝාතනය කරයි

මෑතකදී ඇරඹූ යූටියුබ් නාලිකාව ජනප්‍රිය කරගැනීමට දියණියගේ නිරුවත් ඡායාරූප බලහත්කාරයෙන් ගෙන දැමීමට තැත්කරලා
>>P2

## ජා.ජ.බ. කාන්තා විරෝධතාවට පොලීසියෙන් ජල ප්‍රහාර


ඡායාරූපය: ශාන්ත රත්න...

ඉන්දික ජේවාවිතාරණ

කාන්තා හා ළමා කාර්යාංශයට වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් ජාතික ජනබලවේගයේ කාන්තා සංවිධානය පාර්ලිමේන්තු වටරවුම අසල පැවැත්වූ විරෝධතාවට ඊයේ (04දා) පොලීසිය ජල ප්‍රහාරයක් එල්ල කළේය.

අධික වැසි නොතකා මෙම විරෝධතාව පැවැත්වූ අතර, පොලීසිය විසින් ජල ප්‍රහාර එල්ල කරමින් තිබියදී පවා කාන්තාවෝ අදාළ විරෝධතාවේ නිරත වූහ.

මෙහිදී අදහස් දැක්වූ ජාතික ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය සඳහන් කළේ, කාන්තා හා ළමා කාර්යාංශයට පසුගිය වසරේදී වෙන් කළ මුදල්වලට සාපේක්ෂව මෙවර 51%ක පමණ මුදලක් කප්පාදු කර තිබෙන බවයි.



## ICC ක්‍රිකට් තහනම නොබෝ දිනකින් ඉවතට

10දෙනෙකුගෙන් යුත් නව තේරීම් කමිටුවක්, ප්‍රධානත්වය උපුල් තරංගට

- ක්‍රීඩා ඇමති හරින් ප්‍රනාන්දු
>>P8

## යුද හමුදා ලාන්ස් කෝප්‍රල්වරුන් දෙදෙනෙක් එකම දිනයේ සිය දිවි නසාගෙන

එක් ලාන්ස් කෝප්‍රල්වරයෙකුට ඔහු හා සේවය කළ පිරිස එල්ල කළ පීඩනය දරාගත නොහැකිව දිවි නසාගෙන ඇති බව හෙළිවෙයි

යුද හමුදාවේ විනය පිළිබඳ ගැටලු මතුවනවා

- ගම්පොල රෝහල් හදිසි මරණ පරීක්ෂක
>>P2

## සාමණේර නමක් වසර 3ක් අපයෝජනය කළ

# භික්ෂූන් 10ක් සොයා පරීක්ෂණ

අපයෝජනයට සම්බන්ධ වූවන් අතර විහාරාධිපතිවරු, ජ්‍යෙෂ්ඨ හිමිවරු හා සාමණේර හිමිනමගේ වැඩිමහල් සහෝදරයාත් සිටින බව හෙළිවෙයි

ගම්පොළ - සුරංග දිල්හාන්


බාලවයස්කාර සාමණේර හිමිනමක් වසර තුනක් පුරා බරපතළ ලිංගික අපයෝජනයකට ලක් කළ ප්‍රදේශ කීපයක විහාරස්ථානවල වැඩිහිටි භික්ෂූන් වහන්සේලා දස නමක් සොයා ගම්පොල පොලිස් කොට්ඨාසට අයත් ගලහ පොලීසිය පරීක්ෂණක් අරඹා තිබේ. දහතුන් හැවිරිදි මෙම සාමනේර හිමිනම වයස අවුරුදු 11 සිට මෙසේ අපයෝජනයට ලක්ව ඇතැයි පරීක්ෂණවලින් අනාවරණය වී තිබේ.

තලාතුඔය, රටේමුල්ල, ගලහ ,හොරණ, ගාල්ල ආදී ප්‍රදේශවල විහාරස්ථානවල විහාරාධිපති හිමිවරුන් හා අනෙකුත් භික්ෂූන් මෙම හිමිනම අපයෝජනයට ලක් කර තිබේ. මෙම හිමිනම බොහෝ කාලයක සිට විඳි පීඩාව මවට පැවසීමත් සමගම එම මවගේ පැවිදි වී සිටින අනෙක් පුතා සිටින හොරණ විහාරස්ථානයකට මෙම සාමණේර හිමි භාරදී තිබේ. මෙම හිමියන්ගේ වැඩිමහල් සහෝදරයා අතින්ද මෙම කුඩා හිමිනම අපයෝජනයට ලක්වී තිබේ.

මෙය දැනගත් මව ඉන්පසු එම හිමිනම රැගෙන ගොස් ගාල්ල ප්‍රදේශයේ විහාරස්ථානයකට භාරදී තිබේ. එහිදී මෙම හිමිනමට බඩේ අමාරුවක් සෑදී කරාපිටිය රෝහලට ඇතුළත් කළ පසු වෛද්‍යවරුන් සිදුකළ පරීක්ෂණයකදී මෙම හිමියන් මෙසේ දීර්ඝ කාලයක් අපයෝජනයට ලක්ව ඇති බව සොයා ගෙන තිබේ.

ඒ අනුව උන්වහන්සේ සිටි විහාරස්ථාන පිහිටි පොලිස් ස්ථානවලට මේ පිළිබඳව දැනුම්දුන් පසු මෙසේ පරීක්ෂණ අරඹා තිබේ. මේ පිළිබඳ දැනගත් එම විහාරස්ථානවල හිමිවරුන් පොලීසිය මඟ හරිමින් සිටින බව පරීක්ෂණ පවත්වන ගලහ පොලීසිය පවසයි.


ගම්පොල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රදීප් රත්නායක මහතාගේ උපදෙස් මත ගලහ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සමන් ගුණසේකර ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි ප්‍රධාන පොලිස් පරීක්ෂිකා ධනවතී රණසිංහ ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ පවත්වති.



## අර්ජුනගේ තනතුර මයියාට


>>P8

## 'මිජවුම්' නිසා පළාත් රැසකට තද වැසි


>>P2

## "කටුනායකගෙන් ඉල්ලීම් කළත් මෙතෙක් මට ආරක්ෂාව දී නෑ"

- පා.මන්ත්‍රී රොෂාන් රණසිංහ



දිනේෂ් සමරකෝන්

කටුනායක මහින්ද යාපා අබේවර්ධන මහතාගෙන් ඉල්ලීම් කළද, මෙතෙක් තමන් වෙත ආරක්‍ෂාව ලබාදී නොමැති බව හිටපු ක්‍රීඩා අමාත්‍ය, පා.ම. රොෂාන් රණසිංහ මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේ ඊයේ (04දා) පැවති කාරක සභා අවස්ථාවේ විවාදයේදී අදහස් පළ කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් රොෂාන් රණසිංහ මහතා මෙලෙස අදහස් දක්වා සිටියේය.

"සමහරු දැන් එක එක ඒවා කියන්න පටන් අරගෙන. ආණ්ඩුවෙන් ගියාම ගාමිණී දිසානායක මහතා මැරුවේ මෙහෙමයි. ලලිත් ඇතුලත්මුදලි මහත්මයා මැරුවේ මෙහෙමයි. රොෂාන් රණසිංහවත් මහමග මරලා දැම්මොත් අපි වගකියන්නේ නෑ කියලා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ළඟ අවුරුදු 40ක් ඉඳලා ලියුම් ලියලා ඉවත් වෙලා, ආයේ එතන ඉන්න සුදත් චන්ද්‍රසේකර මම දැක්කා මාධ්‍යයේ කියලා තියෙනවා. මොකක්ද මේ තර්ජනය? මේ තර්ජනය මොන ආකාරයෙන්ද ගේන්නේ? මම කටුනායකතුමාගෙන් ඉල්ලුවා ආරක්‍ෂාව නෑ. අද පාර්ලිමේන්තුවෙන් කෝ රැකවරණයක්? මහජනයා වෙනුවෙන් කතා කිරීමේ අයිතිය කෝ?"



අද
කර්තෘ මණ්ඩලය
ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.
දුරකථන:
2479670, 2479671
ෆැක්ස්:
2479668
විද්‍යුත් තැපැල:
ada@wijeya.lk / adanewspaper@gmail.com
වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830
බෙදාහැරීමේ අංශය:
011 2479 625
දායකත්ව අංශය:
011-2479 626

අද
පාඨක අයිතීන් සුරැකීම
අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka
96, කිරුළ පාර, කොළඹ 05.

| | |
|---|---|
| දුරකතනය | 5 353 635 |
| ෆැක්ස් | 5 335 500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |

# දියණිය බේරාගැනීමට බිරිඳ සිය සැමියා ඝාතනය කරයි

## මෑතකදී ඇරඹූ යූටියුබ් නාලිකාව ජනප්‍රිය කරගැනීමට දියණියගේ නිරුවත් ජායාරූප බලහත්කාරයෙන් ගෙන දැමීමට තැත්කරලා

● ගීතාංජලී ප්‍රියදර්ශනී/ කුරුණෑගල - ජනූර් කිවිලාන්

අන්තර්ජාලයට එක් කර මුදල් සෙවීමේ අරමුණින් දහහතර හැවිරිදි තම එකම දියණියගේ නිරුවත් ජායාරූප බලහත්කාරයෙන් ගැනීමට උත්සාහ දැරූ පියෙකු බිරිඳ විසින් තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කරන ලද සිද්ධියක් වැල්ලව පොලීසියෙන් වාර්තාවේ.

කුරුණෑගල ශික්ෂණ රෝහලේ සහායක උපස්ථායකයෙකු ලෙස සේවය කළ වැල්ලව, තල්විට, බලගහගෙදර පදිංචිව සිටි පී.වී.සුරංග ප්‍රදීප් කුමාර නමැති 37 හැවිරිදි පුද්ගලයෙකු මෙසේ ඝාතනයට ලක්ව ඇත. පෙරේදා (3දා) රාත්‍රියෙහිදී නිවස තුළදීම මෙම ඝාතනය සිදුව ඇති බව පොලීසිය පවසයි. ඔහු කුරුණෑගල ශික්ෂණ රෝහලේ හදිසි අනතුරු හා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ සේවය කළ අයෙකි. ඔහු දියණියකගේ සහ අවුරුදු 8ක පුතෙකුගේ පියෙකි.

සැමියා නිවසේ නාන කාමරය තුළ සිටියදී බිරිඳ ඔහුට මිරිස් කුඩු ගසා ඇති බවද, මිරිස් කුඩු ප්‍රහාරයට ගොදුරුවූ සැමියා ඉන් එළියට පැමිණීමේදී බිරිඳ ඔහුට තියුණු ආයුධ ප්‍රහාරය එල්ලකර ඇති බවද වාර්තාවේ. එම පහරදීම හේතුවෙන් ඔහු නිවසේ සාලය තුළදීම මරණයට පත්ව ඇති බවද පොලීසිය සඳහන් කළේය.

මරණයට පත් පුද්ගලයා මෑතකදී යූටියුබ් නාලිකාවක් ආරම්භ කර ඇති බවද එය ජනප්‍රිය කරවීමේ අරමුණින් නිරුවත් කාන්තා ජායාරූප එක් කරමින් සිටි අයෙකු බවද පොලිස් විමර්ශනවලදී අනාවරණය වී තිබේ. ඒ සඳහා ඔහු අවස්ථා කීපයදීම තම දියණියගේද නිරුවත් ජායාරූප ගැනීම සඳහා උත්සාහ දරා ඇතත් දියණියගේ සහ බිරිඳගේ දැඩි විරෝධය මත එම කාර්යය ඉටුකර ගැනීමට ඔහුට හැකියාවක් ලැබී නැත. මේ හේතුවෙන් මියගිය පුද්ගලයා තම බිරිඳ සමග නිරතුරුවම ආරවුල් ඇතිකරගෙන බිරිඳට පහරදීම් පවා සිදු කර ඇති බවද අනාවරණය වී තිබේ.


පෙරේදා රාත්‍රියේ ඔහු බිරිඳ සහ පුතා නිවසින් එළියට දමා දොර වසා දියණිය නිවස තුළ තනිකරගෙන ඇගේ නිරුවත් ජායාරූප ගැනීමට උත්සාහ කළ අවස්ථාවේදී බිරිඳ නිවසට ඇතුළුවී සැමියා ඝාතනය කර දියණිය බේරාගෙන ඇති බවද කියයි. ඝාතනය සඳහා යොදාගත් කඩුව ඇයගේ මවගේ නිවසේ සිට රැගෙන ආ එකක් බවද අනාවරණය වී තිබේ. මෙම ඝාතනය සම්බන්ධයෙන් සැකපිට මියගිය පුද්ගලයාගේ බිරිඳ වැල්ලව පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. ඇය වෘත්තියෙන් ඇඟලුම් කම්හල් සේවිකාවකි.

කුරුණෑගල ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා සිද්ධිය වූ ස්ථානය නිරීක්ෂණය කිරීමට නියමිතව තිබුණි. වයඹ පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් මහතාගේ උපදෙස් අනුව කුරුණෑගල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී උපුල් චන්දන අබේසිංහ මහතාගේ මෙහෙයවීමෙන් වැල්ලව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අජිත් කුමාර මහතා වැඩිදුර පරීක්ෂණ මෙහෙයවයි.

# 'මිජවුම්' නිසා පළාත් රැසකට තද වැසි

● ඉන්දික හේවාවිතාරණ

'මිජවුම්' සුළි කුණාටුව නිසා බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණ, උතුර, වයඹ පළාත්වලට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බවත්, ඇතැම් ස්ථානවලට මිලිමීටර් 100කට වැඩි තදවැසි පවා ඇති විය හැකි බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානය සඳහන් කරයි.



නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති 'මිජවුම්' (MICHAUNG) සුළි කුණාටුව, අද දකුණු අන්ද්‍රා ප්‍රදේශයේ වෙරළ තීරයෙන් එරට ගොඩබිමට ඇතුළුවනු ඇතැයි එම මධ්‍යස්ථානය පෙන්වා දෙයි.

මේ නිසා ගිගුරුම් සහිත වැසි සමග ඇති විය හැකි තාවකාලික තද සුළංවලින් සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස එම මධ්‍යස්ථානය ජනතාවගෙන් ඉල්ලා සිටියි.

මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල යාත්‍රා කිරීම අවදානම් බැවින් නැවත දැනුම් දෙනතුරු එම මුහුදු ප්‍රදේශයට යාත්‍රා නොකරන ලෙස සහ සෙසු මුහුදු ප්‍රදේශවල අවධානයෙන් කටයුතු කරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටින බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටියි.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර, සුළඟේ වේගය පැ.කි.මී. 30-40 පමණ විය හැකි බවත්, මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 60-70 දක්වා වැඩි විය හැකි අතර, සෙසු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 60-55 දක්වා වැඩි විය හැකි බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

## පැහැදිලි කිරීමයි

පසුගිය 27 දා අද පුවත්පතේ සඳහන් වූ පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා ධුරයෙන් ඉවත් වූ බවට ප්‍රචාරය වුවත් එවැනි තීරණයක් ගෙන නොමැති බවත්, එය අසත්‍යයක් බවට පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මහතා සඳහන් කළ බවත් සඳහන් වූයේ ප්‍රමාද දෝෂයකිනි.

හිටපු පොලිස්පති, කාර්යාල භාණ්ඩ රැගෙන ගිය බවට සඳහන් තොරතුරු අතිශයෝක්තියකින් සිදුකරන ප්‍රකාශ බවත්, නව සේවා දිගුවක් හෝ වෙනත් නිලධාරියෙකු මෙතෙක් පත් කර නොමැති ලෙසට නිවැරදි විය යුතු බවත් සඳහන් කරයි.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

යුනියන් බෑන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී

යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව, හික්කඩුව වැරැල්ලන, "සචින්" අංක 70/A දරන ලිපිනයේ පදිංචි අගම්පොඩි නීල් නන්දන ද සිල්වා (ජාතික හැඳුනුම්පත් අංක 196123303475V) සහ එම ලිපිනයේ පදිංචි මුනසිංහ විතානගේ ධම්මිකා (ජාතික හැඳුනුම්පත් අංක 628572410V දරන) යන අය බන්ධනදායින් වශයෙන් යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් P.H. S.N. ද සිල්වා සහතික කරන ලද 4437 සහ 2018.08.30 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය මගින් යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සි වෙත උකස් කර ඇති පහත විස්තර වන දේපළ.

වර්ෂ 2023 ක් වූ දෙසැම්බර් මස 20 වන දින පෙ. ව. 10.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත්කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ රජ්ගම ප්‍රාදේශීය සභා සීමාවේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 72 B දරන හරන්ගල ග්‍රාම නිලධාරී වසමේ වේරගොඩ නූන්ගල පිහිටි පුවක්වත්තේ බැද්ද හෙවත් නූන්ගල බැද්ද නැමැති ඉඩමේ ඒකාබද්ධ කළ ලොට් A සහ B දරන බිම් කොටස්වලට බලයලත් මිනින්දෝරු ෂෙල්ටන් පීරිස් විසින් මැන සාදන ලද අංක 1140 සහ 2002 සැප්තැම්බර් 17 සහ 18 දින දරන පිඹුරේ නිරූපිත ලොට් C වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසි හතරයි දශම පහක් (අක්. 1 යි පර්. 24.5) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පලතුරු ආදී සියලු දේත් සමගය. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L/101/120 දරන වෙළුම්/පත්ඉරුවේ වර්තමානයේ L 198/40 හි ලියාපදිංචි කොට ඇත.

**දේපළට පිවිසීම:** අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුමේ සිට ගාල්ල දෙසට 6.6 km කහව හන්දිය දක්වා පැමිණ වමට ඇති මීටියාගොඩ පාරෙන් 2.2 km ක් ජයන්ති විහාරය දක්වා පැමිණ දකුණට ඇති හරන්නගල පාරෙන් මීටර් 600 ක් පැමිණි පසු දකුණට වන්නට මෙම විෂයගත දේපළ හමුවේ.


**ගෙවීම් ක්‍රමය:** විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

(1) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) (2) පළාත් අධිකාරියේ බදු සඳහා සියයට එකක් (1%) (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%) (4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000/- (5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 2,000/- (6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය සහ අනෙකුත් වියදම් 100%

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. **නීති දෙපාර්තමේන්තුව, යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ** පීඑල්සී, අංක 64, ගාලු පාර, කොළඹ 03. දුරකතන 011-2347100

**චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ**
**බලයලත් වෙන්දේසිකරු,**
**තක්සේරුකරු, උසාවි කොමසාරිස්,**
**නො. 9-.අයි, හයිලෙවල් පාර,**
**සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.**
**දු.අ. 0714318252, 011-2173282**




# යුද හමුදා ලාන්ස් කෝප්‍රල්වරුන් දෙදෙනෙක් එකම දිනයේ සිය දිවි නසාගෙන

## එක් ලාන්ස් කෝප්‍රල්වරයෙකුට ඔහු හා සේවය කළ පිරිස එල්ල කළ පීඩනය දරාගත නොහැකිව දිවි නසාගෙන ඇති බව හෙළිවෙයි

## යුද හමුදාවේ විනය පිළිබඳ ගැටලු මතුවනවා

## ගම්පොල රෝහල් හදිසි මරණ පරීක්ෂක

● ගම්පොළ -සුරංග දිල්හාන්

යුද හමුදාවේ සේවය කරන දෙදෙනෙක් එකම දිනයක එකම ආකාරයට ගම්පොල සිය නිවෙස් තුළ සියදිවි හානිකරගෙන තිබේ. විසිඑක් හැවිරිදි තෙල්ගේ ලසන්ත පීරිස් ගම්පොල උනම්බුවේ නිවසේත් 42 හැවිරිදි ජයසිංහ දේවලයාගේ චන්ද්‍රපාල පල්ලේ දෙල්තොට සිය නිවසේත් මෙසේ සියදිවි හානිකර ගෙන තිබුණි. මොවුන් දෙදෙනාම යුද හමුදාවේ ලාන්ස් කෝප්‍රල් නිල දැරූ අය වෙති.

යුද හමුදා ඉංජිනේරු බළකා පල්ලේකැලේ කඳවුරේ සේවය කළ ලසන්ත පීරිස් මියගියේ යුද හමුදාවේ එකට සේවය කරන පිරිස එල්ල කරන දැඩි පීඩනය දරා ගැනීමට නොහැකි ව බව ගම්පොල රෝහලේ හදිසි මරණ පරීක්ෂක නලින් ඒ.මැදිවක මහතා ඉදිරියේ ඔහුගේ මව හා පියා සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කළහ. හමුදා කඳවුරේ අය මොහුගෙන් නිතර නිතර මුදල් ඉල්ලා සිදුකරන බලපෑම් හේතුවෙන් එම මුදල් සොයා දීමට ලසන්තගේ මව රන් භාණ්ඩ පවා උකස් කර ඇති බවද මෙහිදී අනාවරණය විය.

මොහුගේ විසි එක්වන උපන් දිනය පසුගිය මස 23 දා සිය නිවසේ දී මහ ඉහළින් සමරා ඇති අතර ඊට පසුදා හමුදා කඳවුරෙන් ලැබුණ දුරකථන ඇමතුම් අනුව එම පිරිස් හට සාදයක් නොපැවැත්වීම පිළිබඳව මොහුට දැඩි ලෙස දෝෂාරෝපණය හා තර්ජනය කළ බව ද මෙහිදී මව පවසා සිටියේ පැමිණි දුරකථන අංක ද පෙන්වමිනි. ඔහුගෙන් බලෙන් මුදල් ලබාගැනීම ඇතුළු විවිධ බලපෑම නිසාම උනම්බුව නිවස තුළදී සිය දිවි නසාගෙන සිටියදී පසුගිය පළමුවන දින සොයාගෙන තිබුණි.

මේ පිළිබඳව මරණ පරීක්ෂණය පැවැත්වූ නලින් මැදිවක මහතා පැමිණ සිටි යුද හමුදා පොලීසියට අවවාද කරමින් ප්‍රකාශ කර සිටියේ මෙවැනි සිද්ධීන්ගෙන් යුද හමුදාවේ විනය පිළිබඳව ගැටලු මතුවන බවත්, බාල වයස්කරුවන්ට දරා ගැනීමේ සීමාවක් ඇති බවත්, ඉහළ නිලධාරීන් මේවා සොයා බැලිය යුතු බවත්ය.

පල්ලේදෙල්තොට පදිංචි හමුදා සෙබළා නිවාඩුවට නිවසට පැමිණ සිටියදී ඇතිවූ පවුල් ආරවුලක් හේතුවෙන් සිය දිවි නසාගෙන ඇති බව පරීක්ෂණ පැවැත්වූ ගලහ පොලීසිය පැවසීය. දෙදරු පියෙකු වූ ඔහු බිරිඳ සමග ඇති වූ ආරවුලක් සමග ගලහ පොලීසියට පැමිණ තිබූ අතර නිවසට ගොස් පළවෙනි දින අලුයම මෙසේ මියගොස් තිබුණි.

මෙහි මරණ පරීක්ෂණය පාතහේවාහැට හදිසි මරණ පරීක්ෂක බී. ජී. ආරියරත්න මහතා විසින් පැවැත් වූ අතර පශ්චාත් මරණ පරීක්ෂණය පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී ඩී.පී.පී.සේනසිංහ මහතා විසින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා සුමිත්‍රයෝ 0707308308 | CCC line 1333
STOP SUICIDE
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926

# සුමින්ද සිරිසේන දිවියෙන් සමුගනී

● මාලන් විදානපතිරණ/ ගම්පහ - තිලකරත්න දිසානායක

සම්මානනීය රූපණ ශිල්පී සුමින්ද සිරිසේන මහතා ඊයේ (04දා) අභාවප්‍රාප්ත විය. මියයන විට ඔහු 75වැනි වියේ පසුවිය. ගම්පහ පෞද්ගලික රෝහලක ප්‍රතිකාර ලබමින් සිටියදී ඔහු මෙලෙස මියගොස් ඇත.

අඩසිය වසකට ආසන්න කාලයක් රූපණ ක්ෂේත්‍රය වෙනුවෙන් අතිවිශිෂ්ට මෙහෙවරක් සිදුකළ ඔහු රූපණයේ යෙදුණු නිර්මාණ අතර මී පුර වැසියෝ, සිංහබාහු, හවකඩතුරාව, මහාසාර, මනමේ වැනි වේදිකා නාට්‍යද, චරිත තුනක්, හිරුට මුවාවෙන්, කුමාරිහාමි, අසල්වැසියෝ, රම්‍ය සුරම්‍ය වැනි ටෙලිනාට්‍යද කැපී පෙනේ.

1969දී ඔහු සිය ප්‍රථම රූපණය මූදු පුත්තු' වේදිකා නාට්‍යයෙන් සනිටුහන් කළ අතර, එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ හවකඩතුරාව' වේදිකා නාට්‍යයේ රූපණය වෙනුවෙන් හොඳම නළුවාට හිමි සම්මානයද දිනාගත්තේය.

2002දී සිව්රංග' නමින් නාට්‍ය පාසලක් පවා පිහිට වූ ඔහු ශිෂ්‍ය කණ්ඩායම් හතරක් ඒ හරහා නිර්මාණය කළේය. කොළඹ ටවර් හෝල් ඇකඩමියේ උපදේශකවරයෙකු ලෙස ඔහු සේවය ආරම්භ කළේ ඉන්පසුවයි.



සුමින්ද සිරිසේනගේ ප්‍රථම ටෙලිනාට්‍යය 1985දී විකාශය වූ සිහින නිම්නය'යි. ඔහුගේ ප්‍රථම සිනමා රංගනය 1976 තිරගත වූ දුහුළු මලක්'වේ. ඉන් අනතුරුව සප්ත කන්‍යා', යකඩ පිහාටු', උප්පලවන්නා', සමනල තටු', ඉර හඳ යට' ඇතුළු චිත්‍රපට කිහිපයකටම දායක වීමට ඔහුට හැකියාව ලැබිණි.

2017දී කලා කීර්ති සම්මානය දිනාගත් ඔහු, ඊට පෙර 2014දී කලා භූෂණ සම්මානයෙන්ද පිදුම් ලැබුවේය. සිරිසේනයන්ගේ දේහය ගම්පහ, ශ්‍රී බෝධි පාර අංක 29/3 දරන නිවසට රැගෙන ඒමට නියමිත අතර, එළඹෙන 07වැනිදා බොරැල්ල රේමන්ඩ් මල්ශාලාවේ තැන්පත් කොට තැබෙන බවත්, අවසන් කටයුතු එදින සවස බොරැල්ල පොදු සුසාන භූමියේදී සිදුකෙරෙන බවත් ඒ මහතාගේ පුත්‍රයෙක් සඳහන් කළේය.

# "ගුරු, විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව විසඳීමට මුදල් වෙන් නොකළොත් දැඩි වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නවා"

## – ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය

● ඉන්දික හේවාවිතාරණ

ගුරු, විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව විසඳීම යටතේ තුනෙන් දෙකක කොටස ලබා දීමට අදාළව රුපියල් බිලියන 46ක මුදලක් වෙන් නොකළහොත් දැඩි වෘත්තීය ක්‍රියා මාර්ග ගන්නා බව ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය සඳහන් කරයි.

අදාළ මුදල් වෙන් කර පවතින ගැටලු විසඳන ලෙස ඉල්ලා අද (05දා) පාර්ලිමේන්තු වටරවුම අසලදී ගුරු විදුහල්පතිවරුන් විරෝධතා ව්‍යාපාරයක් පවත්වන බවත්, එදින අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වැයශීර්ෂයට අදාළ විවාදය පාර්ලිමේන්තුව තුළ සිදුවන බවත් එම සන්ධානයේ සාමාජික ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින් මහතා සඳහන් කළේය.

ගුරු විදුහල්පති වැටුප් විෂමතා විසඳීම යටතේ පසුගිය වසරේ ජනවාරි 01දා සිට තුනෙන් එකක කොටසක් ලබා දෙමින් තිබෙන බවත්, ඉතිරි කොටස් දෙක ලබන ජනවාරි 01 දා සිට ලබා දීමට මෙවර අයවැයෙන් මුදල් වෙන් කරන බවට බලධාරීන් පොරොන්දු වී තිබූ බවත් හෙතෙම පැවසීය. එහෙත් අයවැයෙන් මුදල් වෙන් කිරීමක් සිදුනොකළ බවත් මේ අනුව අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී අදාළ මුදල් වෙන් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් විය යුතු බවත් ලේකම්වරයා සඳහන් කළේය.

පාසල් උපකරණ මිල ඉහළ යාම නිසා දෙමාපියන් දැඩි දුෂ්කරතාවන්ට පත්ව සිටින බවත්, පාසල් නඩත්තුවට නිසි ලෙස මුදල් වෙන් නොකිරීම නිසා පාසල් නඩත්තු කටයුතුවලට බාධා සිදුව තිබෙන බවත්, ගුරු පුරප්පාඩු 40000ක ප්‍රමාණය සම්පූර්ණ නොකිරීම නිසා පාසල් අධ්‍යාපන කටයුතුවලට බාධා සිදුවෙමින් තිබෙන බවත් හෙතෙම පැවසීය.

වැටුප් විෂමතා විසඳීමට අදාළ මුදල් වෙන් කිරීම, පාසල් උපකරණ මිල අඩු කිරීම ඇතුළු ඉල්ලීම් කිහිපයක් මුල් කර ගනිමින් මේ මස 05 දා පැවැත්වෙන විරෝධතාව සවස 2.00 ට පාර්ලිමේන්තු වටරවුම අසලදී පැවැත්වෙන බවත්, මේ සඳහා බස්නාහිර පළාත් ගුරු විදුහල්පතිවරුන් සෘජුවම සම්බන්ධ වන බවත් එම සන්ධානයේ සාමාජික ලංකා ගුරු සේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ මහතා සඳහන් කළේය.

පාසල් කටයුතුවලට බාධා සිදුනොවන ආකාරයට අනෙකුත් පළාත්වල පිහිටි පාසල්වල සේවය කරන ගුරු, විදුහල්පතිවරුන් ද මේ සඳහා සම්බන්ධ වන බවත්, බස්නාහිර පළාතෙන් පිටත විරෝධතා පසුගිය 30 දා පැවැත් වූ බවත් හෙතෙම පැවසීය. ගැටලු විසඳීම සඳහා මුදල් වෙන් නොකළහොත් මේ මස 22 දා ආරම්භ වන පාසල් නිවාඩු කාලය තුළ පවා ගුරු විදුහල්පති වෘත්තීය ක්‍රියා මාර්ග සිදුවිය හැකි බවද සඳහන් කළේය.

# කල්මුණේ පාලිකාව 18දා දක්වා රිමාන්ඩ්



● අම්පාර- වසන්ත චන්ද්‍රපාල

කල්මුණේ ප්‍රදේශයේ පිහිටි පරිවාස සහ ළමා ආරක්ෂක නිවාසයේ රඳවා සිටි 15 හැවිරිදි පිරිමි දරුවකුට පහර දී මරා දමා තිබූ සිද්ධියට සැකපිට අත්අඩංගුවට ගෙන තිබූ එම ළමා නිවාසයේ පාලිකාව ඊයේ (4දා) කල්මුණේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබී ය.

එහිදී කල්මුණේ මහේස්ත්‍රාත් එම්.එස්.එම්.සම්සුදින් මහතා විසින් ඇය මෙම මස 18 දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස නියෝග කරනු ලැබීය. මෙසේ බන්ධනාගාර ගත කරනු ලැබුවේ එම ළමා නිවාසයේ පාලිකාව වන ප්‍රින්ස් පිලේන්ද්‍රන් යන කාන්තාවයි.

කෝවිලක පහන් දෙකක් හොරකම් කිරීම සම්බන්ධයෙන් මඩකලපුව කොකුවිල් පොලීසිය මගින් සැකපිට අත්අඩංගුවට ගෙන මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබා දී තිබූ නියෝගයක් අනුව මෙම දරුවා කල්මුණේ ප්‍රදේශයේ පිහිටි පරිවාස සහ ළමා ආරක්ෂක නිවාසයේ සිටියදී මෙම අවාසනාවන්ත සිද්ධියට මුහුණ පෑමට සිදුවිය.

නැගෙනහිර දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතාගේ උපදෙස් මත , අම්පාර කොට්ඨාස භාර පොලිස් අධිකාරී නන්දන ජයපත්ම මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් කණ්ඩායමක් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# පුද්ගලයෙකු ඝාතනය කළ 2කට මරණීය දණ්ඩනය

● අනුරාධපුර - උපාලි ආනන්ද

පුද්ගල ඝාතන සිද්ධියක් සම්බන්ධයෙන් මහනුවර මහාධිකරණය හමුවේ අධිචෝදනා ලබා සිටි විත්තිකරුවන් දෙදෙනකු එකී චෝදනාවට වරදකරුවන් බවට තීන්දු කළ මධ්‍යම පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණයේ විනිසුරු, ආචාර්ය සුමුදු ප්‍රේමචන්ද්‍ර මහතා විත්තිකරුවන් දෙදෙනාටම මරණ දඬුවම නියම කළේය.

මෙසේ මරණ දඬුවම නියම වූයේ, මහනුවර, උනුමින්න කන්දේ හන්දිය ගුරුබැද්ද පදිංචිකරුවන් වන ඩී.එම්. සමන් කුමාර දිසානායක සහ ඒ.එම්. සමරකෝන් බණ්ඩාර විජේකෝන් යන විත්තිකරුවන්ටය.


විත්තිකරුවන් දෙදෙනාට මරණ දඬුවම නියම කරමින් මහාධිකරණ විනිසුරු, ආචාර්ය සුමුදු ප්‍රේමචන්ද්‍ර මහතා පැවසුවේ, විත්තිකරුවන්ට එරෙහිව පැමිණිල්ල විසින් නගා ඇති චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිලි පාර්ශ්වය සමත්ව ඇති බවයි.

2010 වසරේ ජූලි මස 27වැනිදා හෝ ඊට අසන්න දිනයක මහනුවර මහාධිකරණ බලප්‍රදේශයට අයත් කන්දේ හන්දියේදී සාමි අයියා ධන බාලසිංහම් යන අය ඝාතනය කළ බවට නීතිපතිවරයා විසින් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 296වැනි වගන්තිය ප්‍රකාරව මෙම විත්තිකරුවන්ට එරෙහිව මහනුවර මහාධිකරණය හමුවේ අධිචෝදනා ගොනු කර තිබිණි.

මෙම නඩුවට නම් කර සිටි සාක්ෂිකරුවන් ගණන 14ක් වන අතර, ඉන් සාක්ෂි හතක් ඇසින් දුටු සාක්ෂි වේ. නඩුවේ ලඝු නොවන මූලික විභාගය මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පැවති අතර, නීතිපතිවරයා විසින් විත්තිකරුවන්ට එරෙහිව අධිචෝදනා ගොනු කිරීමෙන් අනතුරුව වැඩිදුර විභාගය සඳහා මහනුවර මහාධිකරණයට යොමු කර තිබිණි.

පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ තාරකා කෝද්‍රාගොඩ මෙනවිය සහ රජයේ අධිනීතිඥ නයනිතාරා බාලපටබැඳි මහත්මිය පෙනීසිටි අතර, විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ නිමල් සුරවීර මහතා පෙනීසිටියේය.

එසේම තලාතුඔය පොලීසිය විසින් සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන මෙහෙයවන ලදී.




# ආරක්ෂාවට, රැකවරණයට යොමු කළ දරුවෙක් ගහලා මැරුවා කියන එක ජාතික අපරාධයක්

**- ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්**

# පාලිකාව විභාගේ පාස් වෙලා ඇවිත් තිබුණත් කිසිදු වෘත්තීය පුහුණුවක් නෑ

**- කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ**

● දිනේෂ් සමරකෝන්

කල්මුණය සුරක්ෂිත මධ්‍යස්ථානයේදී අවුරුදු 15ක ළමයෙකුට පහරදී ඝාතනය කිරීමේ සිද්ධිය ගැන අභ්‍යන්තර පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ මහත්මිය පැවසීය.

පාර්ලිමේන්තුවේදී ඊයේ (04දා) රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා කළ ප්‍රකාශයකින් පසු අදහස් පළ කරමින් අමාත්‍යවරිය මේ බව සඳහන් කළාය.

ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් - අපට ඊයේ අහන්න ලැබුණා වයස අවුරුදු 15ක කොල්ලෙක්ට සුරක්ෂිත මධ්‍යස්ථානයේ පාලිකාවරිය කොස්සෙන් ගහලා මියගිය පුවත. මේක සෝචනීය කාරණාවක්. දරුවාගේ ආරක්ෂාවට, රැකවරණයට ඒ දරුවා යොමු කළ ඒ නිවාසයේ මේ දරුවට කොස්සෙනුයි, විකට් එකෙනුයි ගහලා මැරුවා කියන එක ජාතික අපරාධයක්. මම පියෙක් විදියට, පුරවැසියෙක් විදියට මේ ගැන කනගාටු වෙනවා. මෙවැනි අවස්ථා මේ රටේ වෙන්න පුළුවන්කමක් නෑ. ඒ පිළිබඳ අමාත්‍යාංශයත්, අපේ රජයත් ප්‍රධාන වශයෙන් කටයුතු කරන්න ඕන.

කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ - මේ කල්මුණේ සිද්ධිය ගැන කතා කරන්න ඕන. මේ දරුවා මියයාම ගැන ඊයේ රාත්‍රියේ දැනගත් මොහොතේ සිට වෙහෙස මහන්සි වෙලා මේ පිළිබඳ සොයා බැලුවා. මේ වනවිට අභ්‍යන්තර පරීක්ෂණයකට යොමුකර තිබෙනවා. පොලීසියෙන් ඇයව අත්අඩංගුවට අරන් තියෙනවා. මේ දරුවා දෙමව්පියන් විසින් අත්හැර දමා සිටින දරුවෙක්. කෝවිලක තමයි ඉඳලා තියෙන්නේ. අවුරුදු 15යි වයස. නමුත් පරිවාසය කියන්නේ දරුවන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය, අධ්‍යාපනය සියල්ලම බලාගත යුතු තැනකදී මෙවැනි අවාසනාවන්ත සිද්ධිය වීම ගැන මම අතිශයින්ම කනගාටුවට පත් වෙනවා. මම හොයලා බැලුවා මෙයත් හොර පාරෙන් ආවද කියලා. කවුරු හරි දේශපාලඥයෙක් දාපු කෙනෙක්ද කියලා හෙව්වා. නෑ මෙයා විභාගයට ගිහින් විභාගේ පාස් වෙලා ඇවිල්ලා. ඒත් කිසිදු වෘත්තීය පුහුණුවක් නෑ.

# ජාතික රෝහලේ චර්ම රෝග වාට්ටු නඩත්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවා නෑ

**කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් අතරමග නැවත්වීමෙන් රෝගීන් සෙසු වාට්ටුවලට දමලා**

● නිදර්ශනී වික්‍රමසිංහ

කොළඹ ජාතික රෝහලේ චර්ම රෝග වාට්ටුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අදාළ කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් එම කටයුතු නතර කර ඇති බවත්, ඒ අනුව චර්ම රෝගීන් වෙනත් වාට්ටුවල රඳවා තැබීම තුළ දැඩි අවදානමක් මතුව ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රකාශකයෙක් අද'ට පැවසීය.

කෙසේ වුවද මේ පිළිබඳ සිදුකළ සොයා බැලීමේදී වාර්තා වූයේ, ජාතික රෝහලේ 13වැනි වාට්ටුව හෙවත් මෙම චර්ම රෝග වාට්ටුව මේ වනවිට වසා දැමීමකට ලක් කර නොමැති බවයි.

එහෙත් එම වාට්ටුව සැලකිය යුතු කාලයක සිට ප්‍රතිසංස්කරණය කරමින් පවතින අතර, ගෙවීම් සිදුකර නොමැති වීම තුළ කොන්ත්‍රාත්කරුවන් අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු නවතා දමා තිබේ.

ඒ අනුව චර්ම රෝගීන් වෙනත් වාට්ටුවල රඳවා ප්‍රතිකාර ලබාදෙන බවත්, එම තත්ත්වය අනෙකුත් රෝගීන්ට අවදානමක් ඇති කරවන බවත් ඉහත ප්‍රකාශකයා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

# දුෂ්කර ප්‍රදේශවල පාසල් සිසුන්ට හා පිරිවෙන් භික්ෂූන් 747,093කට පාවහන් තිළිණපත්

● නවෝද්‍යා පවනි

දිවයිනේ දුෂ්කර, අතිදුෂ්කර සහ හුදකලා ප්‍රදේශවල පිහිටි පාසල් සහ තෝරාගත් පිරිවෙන්වල භික්ෂූන් වහන්සේලා, සිල් මාතාවන් සහ සිසු දරු දැරියන් 747,093ක් වෙනුවෙන් මෙවර පාවහන් තිළිණ පත් ලබාදෙන බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි.

මේ සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියන 2,200කි. මෙවර පාසල් පාවහන් තිළිණ පතක වටිනාකම රුපියල් 3,000කි. තිළිණපත් සඳහා පාවහන් අලෙවි කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචිය ලත් වෙළෙඳ සැල් වෙතින් සිසුන්ට පාවහන් ලබාගැනීමට අවස්ථාව සලසා තිබේ.

මේ සම්බන්ධව දෙමවුපියන් සහ සිසුන් දැනුම්වත් කිරීම වෙනුවෙන් අදාළ උපදෙස් පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන බලධාරීන් වෙත යොමු කර ඇති අතර, මීට අදාළ චක්‍රලේඛයක්ද පාසල් වෙත නිකුත් කර ඇත.

# ඔක්තෝබර් අපනයන 14.6%කින් පහළ යයි

● ෂමිල පෙරේරා

2022 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2023 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ වෙළෙඳ භාණ්ඩ අපනයනය ඇ.ඩො. මිලියන 898ක් දක්වා 14.6%කින් පහළ ගොස් තිබේ.

ශ්‍රී ලංකා රේගුව විසින් නිකුත් කරන ලද තාවකාලික දත්තවලට අනුව එය 2023 සැප්තැම්බර් මාසයේ වාර්තා වූ අගයට සාපේක්ෂවද 13.13%ක අඩුවීමකි.

විශේෂයෙන්ම, ඇඟලුම් සහ රෙදිපිළි, රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වැනි ක්ෂේත්‍රවල අපනයන නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අඩුවීම වෙළෙඳ භාණ්ඩ අපනයන පහත වැටීමට හේතු වී තිබේ.

# අධිකරණ විනිසුරුවරයෙකුට සාප වේවා' කී පා.ම. රිෂාඩ්, පාර්ලිමේන්තුවේදී ප්‍රසිද්ධියේ සමාව ගත යුතුයි

**- ඇමති විජයදාස රාජපක්ෂ**

## අමාත්‍යවරයාගේ චෝදනාවට අද පිළිතුරු දෙනවා

**- පා.මන්ත්‍රී රිෂාඩ් බද්‍යුදීන්**

● දිනේෂ් සමරකෝන්

පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වී අධිකරණයේ විනිශ්චයකාරවරයෙකුට සාප වේවා' යනුවෙන් ප්‍රකාශ කළ පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බද්‍යුදීන් මහතා පාර්ලිමේන්තුවේදී ප්‍රසිද්ධියේ සමාව ගත යුතු බව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේදී ඊයේ (04දා) ප්‍රකාශයක් කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

කෙසේ වෙතත් අමාත්‍යවරයා නගපු චෝදනා සම්බන්ධයෙන් අද (05දා) දිනයේදී අදහසක් පළ කරන බවද එහිදී අදහස් දැක්වූ රිෂාඩ් බද්‍යුදීන් මන්ත්‍රීවරයා පැවසීය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ - රිෂාඩ් බද්‍යුදීන් මන්ත්‍රීතුමා අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දවසේ එතුමාගේ නඩුවක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරලා, ඒ සම්බන්ධයෙන් කියා සිටියා ඒ නඩුකාරතුමාට ඔහු සාප කරනවා කියලා. ඒ අනුව රිෂාඩ් බද්‍යුදීන් මහතාගේ මූලික අයිතිවාසිකම් නඩුව මුලින්ම අහපු වෙලාවේ විනිශ්චය ආසනයේ ජනක් ද සිල්වා මහතා නඩුවෙන් ඉවත් වුණා. ඒකට හේතුව වුණේ රිෂාඩ් බද්‍යුදීන් මහතාට විරුද්ධව විල්පත්තුවේ වන සංහාරය සම්බන්ධයෙන් වන්දි ගෙවන්න කියලා නඩු තීන්දුවක් දීලා තිබුණා. ඉන්පසුව ඉවත් වුණේ සමයවර්ධන විනිසුරුතුමා. තුන්වනුව ඒ නඩුව කැඳවූ වෙලාවේ යසන්ත කෝද්‍රාගොඩ මහතා ඉවත් වුණා. ඒකට හේතුව මම කියන්නේ නෑ. ඒක කිව්වොත් රිෂාඩ් බද්‍යුදීන් මහතාටත් කැලලක් වෙයි. හතරවනුව තමයි ඒ.එච්. එම්. නවාස් මහතා ඉදිරියේ මේ නඩුව කැඳවනු ලැබුවේ. එතුමත් මේ නඩුවෙන් ඉවත් වුණා.

එතුමා ඉවත්වීම ගැන හේතු කිව්වේ නෑ. රිෂාඩ් බද්‍යුදීන් මන්ත්‍රීවරයාගේ මූලික අයිතිවාසිකම් පෙත්සම අධිකරණයේ කැඳවීමට නියමිත දිනට පෙර දිනයේ රාත්‍රියේ නඩුවට පෙනීසිටින කනිෂ්ඨ නීතිඥයා දුරකථනයෙන් ඒ විනිසුරුතුමාට කතා කරලා කියලා තියෙනවා ජ්‍යෙෂ්ඨ නීතිඥතුමාට අවශ්‍ය වෙනවා ඔබතුමා ඉදිරියේ මේ නඩුව අහලා ඉවර කරන්න කියලා. පසුවදා උදේ ජ්‍යෙෂ්ඨ නීතිඥතුමා කතා කරලා නවාස් විනිසුරුතුමාට කියලා තියෙනවා ඔබතුමා ඉදිරියේ මේ නඩුව ගන්න එපා කියලා. ඒක එතුමා අගවිනිසුරුතුමාව දැනුවත් කරලා.

පාර්ලිමේන්තු අපේ වරප්‍රසාද පාවිච්චි කරලා මන්ත්‍රීවරුන් මෙහෙම විනිසුරුවරුන්ට අගෞරව කරන්න, සාප කරන්න ගත්තම කොහොමද ව්‍යවස්ථාදායකයයි අධිකරණයයි එකට කටයුතු කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න? ඒ මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය බරපතළයි. කරුණාකරලා එතුමාට කියන්න පාර්ලිමේන්තුවේ ප්‍රසිද්ධියේ සමාව අයදින්න කියලා.

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බද්‍යුදීන්** - මගේ මිත්‍ර විජයදාස රාජපක්ෂ මහතා මම නැති වෙලාවේ මගේ නම කියලා එතුමාගේ අමාත්‍යාංශයේ කතා කරපු එකක් ගැන ප්‍රකාශ කළා කියලා අපේ මන්ත්‍රීවරුන් කිව්වා. මම හිටියේ නෑ එතුමා මොනවාද කිව්වේ කියලා දැනගන්න. ඒ නිසා මට හෙට අවස්ථාවක් දෙන්න මේකට උත්තර දෙන්න.

# ගෙවුණු දින 4 තුළ ඩෙංගු රෝගීන් 999ක් වාර්තා වෙයි

● ඉන්දික හේවාවිතාරණ

මේ මාසයේ ගෙවීගිය දින4ක කාලය තුළදී ඩෙංගු රෝගීන් 999ක් වාර්තා වී තිබෙන බව සෞඛ්‍ය අංශ පෙන්වා දෙයි.

මේ වසරේ ජනවාරි 01වැනිදා සිට ඊයේ (04දා) දිනය දක්වා කාලය තුළදී ඩෙංගු රෝගීන් 77,487ක් වාර්තා වී තිබෙන අතර, ඉන් රෝගීන් 46ක් මියගොස් තිබෙන බවත් ඩෙංගු රෝගය මේ වනවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස බලප්‍රදේශ 54ක අධිඅවදානම් මට්ටමින් පැතිර යන බවද සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

සමස්ත රෝගීන් ප්‍රමාණයෙන් රෝගීන් 36,266ක් වාර්තා වීතිබෙන්නේ, බස්නාහිර පළාතෙන් වන අතර, ප්‍රතිශතයක් ලෙස සැලකූ විට එය47.1%කි.

මධ්‍යම පළාත තුළින් රෝගීන් 9,718ක් වාර්තා වී තිබෙන අතර, සමස්ත රෝගීන්ගේ ප්‍රමාණය සැලකූ විට එය 12.5%ක ප්‍රමාණයක් වේ. වයඹ පළාත තුළින් රෝගීන් 6,684ක් වාර්තා වී තිබෙන අතර, එය ප්‍රතිශතයක් ලෙස 8.6%කි. එසේම සබරගමුව පළාත තුළින් රෝගීන් 6,290ක් වාර්තා වී තිබෙන අතර, එය ප්‍රතිශතයක් ලෙස 82%කි.

සමස්ත රෝගීන් ප්‍රමාණයෙන් වැඩිම රෝගීන් ප්‍රමාණයක් වාර්තා වී තිබෙන්නේ, කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර, එම දිස්ත්‍රික්කයෙන් රෝගීන් 16,363ක් වාර්තා වී තිබේ.

එසේම ගම්පහ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 15,162ක්, කළුතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 4,741ක්, මහනුවර දිස්ත්‍රික්කයෙන් 7,804ක්, පුත්තලම දිස්ත්‍රික්කයෙන් 3,622ක්, රත්නපුර දිස්ත්‍රික්කයෙන් 3,044ක් හා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 3,246ක් වාර්තා වී තිබෙන අතර, පොදුවේ සෑම දිස්ත්‍රික්කයකින්ම රෝගීන් වාර්තා වී ඇත.

# ඛනිජතෙල මිල්කෝට දුන් ඩීසල් ලීටර් 165,300ක්

## කර්මාන්ත ශාලාවේ ටැංකිවලට ගොඩ බා නෑ

**- විගණන වාර්තාවකින් හෙළිවෙයි**

● චන්දන සමරවික්‍රම

ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් මිල්කෝ ආයතනයට අයත් අඹේවෙල කර්මාන්තශාලාව සඳහා පසුගිය වසර 08ක කාලසීමාව තුළ (2015 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31) දක්වා නිකුත් කරනු ලැබූ රුපියල් එක්කෝටි හැත්තෑ දෙලක්ෂ නමදහස් හාරසිය හැටහතක් වටිනා ඩීසල් ලීටර් 165,300ක් මිල්කෝ ආයතනයේ කර්මාන්තශාලාවේ තෙල්ටැංකිවලට ගොඩබෑමේ කටයුතු සිදුවී නොමැති බව ජාතික විගණන කාර්යාලය සඳහන් කරයි.

එමෙන්ම පසුගිය වසර 6 තුළදී (2017 වර්ෂයේ ජනවාරි 01වැනිදා සිට 2022 වර්ෂයේ අගෝස්තු 31වැනිදා) රුපියල් 9,364,835ක් වටිනා ඩීසල් ලීටර් 92,400ක් රැගත් බවුසර් රථ 14ක් කර්මාන්තශාලාව වෙත පැමිණ නොතිබූ නමුත්, එම ඉන්ධන සඳහා ගෙවීම් සිදුකර තිබිණි.

එසේම ඇතැම් ඉන්ධන තොග සම්බන්ධයෙන් ඉන්වොයිස්වල දැක්වෙන අත්සන් ආරක්ෂක අංශයේ නිලධාරීන්ගේ අත්සන් හා නොසැසඳෙන බවට එම විගණන වාර්තාවේ සඳහන් වේ. පසුගිය 03වැනිදා නිකුත් කරන ලද නවතම විගණන වාර්තාවක සඳහන් වේ.

එමෙන්ම අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ විදුලි ජනක යන්ත්‍රය සඳහා ටැංකිවලින් ඩීසල් නිකුත් කිරීමේදී ඩීසල් ලීටර් 58,703 ප්‍රමාණයක් අස්ථාන ගතවී ඇති බවද එම විගණන වාර්තාව මගින් අනාවරණය වී ඇත.

අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ ඉන්ධන මිලදී ගැනීමේදීහා නිකුත් කිරීමේදී සිදුවී ඇති වංචාවන් අනුව එහි අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක ඇති බවට නිරීක්ෂණය වන බවද එම විගණන වාර්තාවේ සඳහන් වේ.

ඉන්ධන අක්‍රමිකතාවන්ට සම්බන්ධ පාර්ශ්වයන්සඳ හා විනයානුකූලව පියවර ගත යුතු බවද විගණනය මගින් නිර්දේශ කර ඇත.

මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින්ද පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව සමාගමේ කළමණාකාරීත්වය විසින් විගණනයට සඳහන් කර ඇත.

# වීසා නොමැතිව කුවේටයේ රැඳී සිටි 35ක් මෙරටට පිටුවහල් කෙරේ

● කටුනායක -ඒ.කේ.ජී.කපිල

ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව කුවේට් රාජ්‍යයේ නීතිවිරෝධී ලෙස වීසා නොමැතිව දිගු කලක් රැඳී සිටි ශ්‍රී ලාංකික ගෘහ සේවයේ නිරත වී සිටි 35 දෙනෙකු ඊයේ (04දා) උදෑසන එරටින් පිටුවහල් කර කටුනායක ගුවන් තොටුපොළ වෙත එවා තිබුණි .

මොවුන් මෙසේ කුවේට් රාජ්‍යය තුළ ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව , එරට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී සිටි ශ්‍රී ලාංකිකයන් පිරිසක් වන අතර , එක් පිරිමි ගෘහ සේවකයෙකු සහ ගෘහ සේවිකාවන් 34 දෙනෙක් මෙම පිරිසට ඇතුළත් වී සිටියහ .

කුවේට් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, එරට අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය , ආගමන විගමන දෙපාර්තමේන්තුව , අධිකරණ අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය සමග එකඟතා ඇති කර ගනිමින් මෙම ශ්‍රී ලාංකික ගෘහ සේවයේ නිරත පිරිස ශ්‍රී ලංකාවට එවීමට පියවර ගෙන තිබුණි. එහිදී මෙම සේවකයන්ට එරෙහිව පැවති නඩු සමථයකට පත් කර , තාවකාලික ගමන් බලපත්‍ර සකස් කර, ගුවන් ප්‍රවේශ පත්‍ර ලබා දී, හිඟ වැටුප් මෙන්ම අනෙකුත් ඔවුන්ට හිමි විය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව ද ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හිමි කර දී තිබුණි .

# මාවා කිලෝ පහක් සමග සැකකරුවෙක් අත්අඩංගුවට



● මොරටුව - රේඛා තරංගනී ෆොන්සේකා

දුම්කොළ මිශ්‍ර මාවා කිලෝ පහක් සන්තකයේ තබාගත් සැකකරුවෙක් පෙරේදා (03දා) ලුනාවේදී අත්අඩංගුවට ගත් බව අඟුලාන පොලීසිය සඳහන් කළේය.

එම ප්‍රදේශයේ පදිංචි 32 හැවිරිදි පුද්ගලයෙක් මෙසේ අත්අඩංගුවට පත්ව තිබේ.

මත්වීමට යොදන බව කියන මෙම මාවා පාසල් දරුවන් සහ තරුණ කණ්ඩායම් ඉලක්ක කොට අලෙවි කිරීමට ගෙනෙන්නට ඇති බවට පොලීසිය සැක කරයි.

මෙම සැකකරු මීට පෙරද මෙවැනි ජාවාරම්ක නියැළී ඇති බව පොලීසිය පැවසීය. ඔහු ලී භාණ්ඩ වර්ණ ගැන්වීමේ රැකියාවල ද විටින් විට නිරතවන පින්තාරුකරුවෙක් බව පැවසීය.

සැකකරු මාවා කුඩා පැකට්ටු ලෙස සකසා රුපියල් 100කට අලෙවි කර ඇති බවද පොලීසිය පැවසීය. අඟුලාන පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# ව්‍යාජ වීසා මගින් ඉතාලියට යෑමට තැත්කළ තරුණයෙක් හා තරුණියක් දැලේ

● කටුනායක - ටී.කේ.ජී.කපිල

ව්‍යාජ වීසා බලපත්‍ර යොදා ගනිමින් කටාර් රාජ්‍යයේ දෝහා ඔස්සේ ඉතාලියට පලා යාමට තැත් කළ ශ්‍රී ලාංකික තරුණයෙකු සහ තරුණියක පෙරේදා (03දා) අලුයම කටුනායක ගුවන්තොටුපලේ පිටත්වීමේ පර්යන්තයේ දී ආගමන විගමන දේශසීමා ආවේක්ෂණ ඒකකයේ නිලධාරීන් පිරිසක් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

නිට්ටඹුව,වතුපිටිවල ප්‍රදේශයේ පදිංචි 35 හැවිරිදි තරුණයෙකු හා 25 හැවිරිදි තරුණියක මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

එදින අලුයම 03.25 ට දෝහා බලා පිටත්ව යාමට නියමිතව තිබූ කටාර් ගුවන් සේවයට අයත් ගුවන් යානයකට ගොඩවීමට ඔවුන් කටුනායක ගුවන්තොටුපොළට පැමිණ තිබේ.

එහිදී සිය ගුවන් සේවා නිශ්කාශන කටයුතු සඳහා කටාර් ගුවන් සේවා නිලධාරීන්ට ඉදිරිපත් කර තිබූ ඉතාලි වීසා බලපත්‍ර දෙක පිළිබඳ සැක සිතූ එම නිලධාරීන්, මොවුන් කටුනායක ගුවන්තොටුපොළ ආගමන විගමන දේශසීමා ආවේක්ෂණ ඒකකයේ නිලධාරීන්ට භාර දී ඇත.

එහිදී සිදු කළ විමර්ශනවලදී මෙම වීසා බලපත්‍ර දෙක ව්‍යාජ ලෙස සකස් කළ ඒවා බවට අනාවරණය වී තිබේ .

මේ පිළිබඳ සැකකාර දෙදෙනාගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී පවසා ඇත්තේ තමන් තැරැව්කරුවෙකුට රුපියල් ලක්ෂ 40 බැගින් රුපියල් ලක්ෂ 80ක් ලබා දී මෙම වීසා බලපත්‍ර දෙක සකස් කර ගත් බවත්. ඔහු තමන් කටුනායක ගුවන්තොටුපොළ තෙක් රැගෙන විත් ඇරලවූ බවත් ආගමන විගමන දේශසීමා ආවේක්ෂණ ඒකකයේ නිලධාරීන් හමුවේ සැකකාර යුවළ ප්‍රකාශ කර තිබිණි.

අත්අඩංගුවට පත් යුවළ වැඩිදුර විමර්ශන කටයුතු සඳහා කටුනායක ගුවන්තොටුපොළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට භාර දීමට පියවර ගෙන තිබේ.

# කුඹුරු යාය දෙකකදී අකුණුසැර වැදීමෙන් ගොවීන් දෙදෙනෙක් මරුට

● එස්.කරුණාරත්න/ නිකවැරටිය - ප්‍රියානි මංගලිකා



පවතින අයහපත් කාලගුණයත් සමග ගලේවෙල හා කොටවෙහෙර පොලිස් වසමේ නැබඩවැව යන ප්‍රදේශවල කුඹුරු යායන්වලදී අකුණුසැර වැදීමෙන් දෙදෙනෙකු ජීවිතක්ෂයට පත්ව සිටිති.

ගලේවෙල ප්‍රදේශයේ කුඹුරක වී වපුරමින් සිටි ගොවියෙකු අකුණුසැර වැදීමෙන් පෙරේදා (03දා) මියගොස් ඇතැයි ගලේවෙල පොලීසිය සඳහන් කරයි.

මෙසේ මියගොස් ඇත්තේ දඹුල්ල, බුලාගල ප්‍රදේශයේ පදිංචි එම්.ඒ.සෝමතිලක (60) නමැති දෙදරු පියෙකු මෙසේ ජීවිතක්ෂයට පත්ව තිබේ.

අකුණුසැර වැදුණු පුද්ගලයා වහා ගලේවෙල රෝහලට ඇතුළත් කිරීමට
පියවර ගත්තද ඒ වනවිටත් ඔහු ජීවිතක්ෂයට පත්ව සිට ඇත.

මේ අතර කොටවෙහෙර, නැබඩවැව කුඹුරු යායේ පැලක තිබූ, අකුණුසැර වැදීමෙන් මියගිය බවට සැකකෙරෙන ගොවි මහතෙකුගේ සිරුරක් පෙරේදා (03දා) සොයාගෙන ඇති බව පොලීසිය පවසයි.

කරුවලගහවත්ත, දිගන්නෑව ප්‍රදේශයේ පදිංචිව සිටි 30 වියැති ගොවි මහතෙකු මෙසේ ජීවිතක්ෂයට පත්ව ඇති බවට පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

මරණකරුට අයත් නැබඩවැව කුඹුරු යායේ පිහිටි තම කුඹුරට වගා කටයුතු සඳහා වැසි සහිත මෙදින උදෑසන ගොස් ඇති බවත්, මොහු පැලේ මැස්ස මත වැටී සිටින අයුරු අසල් වැසි ගොවි මහතුන් දැක ඇති බවට පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

# රු.කෝටි 2ක කුලී වෑන් රථයක් උකස් කර විදෙස්ගතව සිට පැමිණි සැකකරුවෙක් රිමාන්ඩ්

● වරුණ ආනන්ද ඉ ජයකොඩි

කුලී ගමන් යාමට භාර දී තිබූ රුපියල් කෝටි දෙකක් පමණ වටිනා වෑන් රථයක් රුපියල් ලක්ෂ පහළොවකට උකස් කර විදේශ රටකට පැන ගොස් සිටි සැකකරුවෙකු මේ මස 11 වැනිදා දක්වා රිමාන්ඩ් භාරයේ රඳවා තැබීමට අත්තනගල්ල අංක 02 මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා ඊයේ (04දා) නියෝග කළේය.

කටාන, කලුආරප්පුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු එසේ රිමාන්ඩ් කැරිණි.

නිට්ටඹුව ප්‍රදේශයේ පදිංචි නාවික හමුදා නිලධාරියෙකුට අයිති රුපියල් කෝටි දෙකක් පමණ වටිනා වෑන් රථයක් කුලී ගමන් යාමට භාර දී තිබියදී එය රුපියල් ලක්ෂ පහළොවක මුදලකට උකස් කර 2022.10.14 වැනිදා සැකකරු ඩුබායි රටට පැන ගොස් සිට නැවත පසුගිය 02වැනිදා දිවයිනට පැමිණි පසුව කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ දී අත් අඩංගුවට ගත් බව විවෘත අධිකරණයේදී අනාවරණය විය.

මේ වන විට එම වාහනය අස්ථානගත වී ඇති බවත් එය සොයා ගැනීමට වැඩිදුරටත් පරීක්ෂණ පවත්වාගෙන යන බවද පොලීසිය අධිකරණයට දැන්විය.

මෙහිදී පොලීසියේ කරුණු දැක්වීම්වලින් අනතුරුව එසේ සැකකරු රිමාන්ඩ් භාරයේ රඳවා තැබීමට නියෝග කැරිණි.

නැවත කැඳවීම මේ මස 11වැනිදාට කල් තබන ලදී.

ගම්පහ කොට්ඨාස විශේෂ අපරාධ විමර්ශන ඒකකය පැමිණිල්ල මෙහෙය විය.

# ඉදිකරමින් තිබූ ගොඩනැගිල්ලක වහළයෙන් වැටී ඉදිකිරීම් සේවකයෙක් ජීවිතක්ෂයට

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

බණ්ඩාරගම කළුතර පාරේ කර්මාන්තශාලාවක ඉදිකරමින් පවතින ගොඩනැගිල්ලක වහලයකින් වැටී 24 හැවිරිදි හිටපු කොමාන්ඩෝ සෙබළෙකු මියගොස් ඇතැයි බණ්ඩාරගම පොලීසිය සඳහන් කරයි.

තිහගොඩ, කලෝල්පිටිය බෙන්ටිස්හේන පදිංචිව සිටි නිශාන්ත ලක්මාල් නමැති එක් දරු පියෙකු මෙසේ ජීවිතක්ෂයට පත්ව ඇත.

කර්මාන්තශාලාවේ තෙමහල් ගොඩනැගිල්ලේ වහලය ඉදිකිරීමට කොන්ත්‍රාත් පදනම මත ලබා ගත් පුද්ගලයකු යටතේ මියගිය අය සහ තවත් පුද්ගලයන් දෙදෙනෙකු සේවය කර තිබේ.

මේ අතර පෙරේදා (03දා) සවස වැඩ නිමවා එයින් බිමට බැසීමට සූදානම් වීමේ දී අඩි 20ක පමණ උසකින් තෙවැනි මහලේ, අභ්‍යන්තර කොන්ක්‍රීට් තට්ටුවට වැටීමෙන් මෙම අනතුර වී ඇති බව පොලීසිය සිදු කළ මූලික විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

අනතුරින් බරපතළ තුවාල ලැබූ පුද්ගලයා බණ්ඩාරගම රෝහලට ඇතුළත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා පානදුර මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇතැයි පොලීසිය පවසයි. සිද්ධිය වූ ස්ථානයට පානදුර කොට්ඨාස අපරාධ පරීක්ෂණාගාර නිලධාරීන් පැමිණ පරීක්ෂණ පැවැත්වූහ.

බණ්ඩාරගම පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# ගජමුතු දෙකක් රු. ලක්ෂ 53කට අලෙවි කිරීමට තැත්කළ අයෙක් අත්අඩංගුවට

● මීරිගම කාන්ති

රුපියල් ලක්ෂ 53ක මුදලකට විකිණීමට ගෙන යමින් තිබූ ගජමුතු දෙකක් සමග පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් බව දිවුලපිටිය පොලීසිය සඳහන් කරයි.

රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු මෙසේ අත්අඩංගුවට පත්ව ඇත.

දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපතිවරයාට ලත් තොරතුරක් මත දිවුලපිටිය නගරයේදී සිදු කෙරුණු පරීක්ෂාවකදී මෙම සැකකරු අත්අඩංගුවට ගෙන තිබිණි.

සැකකරු විසින් දිවුලපිටිය ප්‍රදේශයේ පුද්ගලයකුට මෙම ගජමුතු විකිණීමට රැගෙන ආ අවස්ථාවේ මෙසේ අත්අඩංගුවට පත් වී ඇත. දිවුලපිටිය පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# සබරගමුව වෛද්‍ය පීඨයේ ගැටලුවලට විසඳුම් ඉල්ලා විරෝධතාවක්





● රත්නපුර - ලසන්ත නිරෝෂණ පෙරේරා

සබරගමුව වෛද්‍ය පීඨයේ පවතින ගැටලුවලට නිසි විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලම් කරමින් සබරගමු වෛද්‍ය පීඨ සිසුන් සංවිධාන කළ විරෝධතාවක් හා ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ඊයේ (04දා) රත්නපුර නගරයේදී පැවැත්විණි. සබරගමු වෛද්‍ය පීඨ ශිෂ්‍ය සංගමය විසින් සංවිධාන කළ වීදි නාට්‍ය රඟ දැක්වීමක් ද සංවිධානය කර තිබිණි.

අඛණ්ඩ සත්‍යග්‍රහය විරෝධතා පෙළපාළිද සමග සබරගමු වෛද්‍ය පීඨයට මහාචාර්ය ඒකකයක් ඇතුළු පහසුකම් ලබාදෙන ලෙස සිදු කළ අරගල අඛණ්ඩව සිදු කරන බව සබරගමු වෛද්‍ය පීඨ ශිෂ්‍ය සංගමය පවසයි.

# විදුලිය විසන්ධි කිරීමට ආ ලංවිම සේවකයන්ට පහරදීලා

● ගම්පහ - තිලකරත්න දිසානායක

විදුලිය විසන්ධි කිරීමට ගිය විදුලි බල මණ්ඩලයේ සේවකයන් දෙදෙනෙකුට ගම්පහ නගරයේදී ඊයේ (04දා) දහවල් පහරදීමක් සිදුව ඇති බව පොලීසිය සඳහන් කරයි.

ගම්පහ නගර මධ්‍යයේ පිහිටි ව්‍යාපාර ස්ථානයක විදුලිය විසන්ධි කිරීමට ගිය අවස්ථාවේදී මෙලෙස පහරදීම සිදුව ඇත.

මෙලෙස පහර කෑමට ලක්ව ඇත්තේ 56 සහ 44 වියෙහි පසුවන විදුලි පාරිභෝගික සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකි.

පහර කෑමට ලක්වූ සේවකයන් දෙදෙනා ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලට ඇතුළත් කිරීමට පියවර ගනු ලැබූ බව විදුලි බල මණ්ඩලයේ ප්‍රකාශකයෙක් පැවසීය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගම්පහ උසස් පොලිස් නිලධාරියෙකුගෙන් කළ විමසීමේදී සඳහන් කර සිටියේ, සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණ ආරම්භ කොට ඇති බවයි.

# මාරක රිය අනතුරක් කළ බස් කොන්දොස්තරට මාස 7කට පසු මරණකරුගේ ඥාතීන් පහර දීලා

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

අනතුරකින් තරුණයකු මියයාම සම්බන්ධයෙන් පළිගැනීමක් ලෙස පිටකොට්ටේ පාගොඩ පාරේදී බස් කොන්දොස්තරවරයෙකුට තියුණු ආයුධවලින් පහර දී බරපතළ තුවාල සිදු කළ බව කියන ඥති සොයුරන් දෙදෙනකු ඇතුළු තිදෙනකු අත්අඩංගුවට ගත් බව මිරිහාන මූලස්ථාන පොලීසිය සඳහන් කරයි.

පිටකෝට්ටේ, බැද්දගාන ප්‍රදේශයේ පදිංචිකරුවෝ තිදෙනෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

සැකකරුවන් පහර දීමට යොදා ගත් තියුණු ආයුධ තුනක්ද පොලිස් භාරයට ගෙන ඇත.

අපරාධය සිදුවී පැය 12ක කාලයකදී සැකකරුවන් අත්අඩංගුවට ගත් බව පොලීසිය සඳහන් කරයි.

බරපතළ තුවාල ලද නුගේගොඩ ප්‍රදේශයේ පදිංචි 23 හැවිරිදි කොන්දොස්තරවරයා ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇත.

මාර්ග අංක 176 කරගම්පිටිය - හෙට්ටියාවත්ත පෞද්ගලික බස් රථයක කොන්දොස්තරවරයා ලෙස රැකියාව සිදු කරන මොහු පෙරේදා (03දා) අලුයම පහට පමණ රැකියාවට පැමිණ බස් රථය පිරිසුදු කිරීමේ යෙදී සිටියදී යතුරුපැදියකින් පැමිණ තිබූ සැකකරුවන් තිදෙනා තියුණු ආයුධවලින් පහර දී පලා ගොස් තිබිණි.

මෙම වසරේ අප්‍රේල් 25වැනි දින තුවාල ලද කොන්දොස්තරවරයා ත්‍රීරෝද රථයක් පදවාගෙන යමින් සිටියදී යතුරුපැදියකින් ගමන් කරමින් තිබූ තරුණයකු අනතුරට ලක්ව මියගොස් තිබූ අතර ඊට පළිගැනීමක් ලෙස ඔහුගේ ඥති සොයුරන් විසින් මෙම පහරදීම සිදු කර තිබූ බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී ඇත.

ඒ බව පවසා කොන්දොස්තරවරයාගේ මව ද පොලීසියට ප්‍රකාශ ලබා දී තිබේ.

මිරිහාන මූලස්ථාන පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# ඇමති ටිරාන්ගේ පුත්‍රයා රථවාහන වැරද්ද පිළිගෙන දඩය ගෙවයි

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

මහනුවර, ගලගෙදර10 කණුව ප්‍රදේශයේදී රථවාහන නීති උල්ලංඝනය වන සේ මෝටර් රථයක් ත්‍රිරෝද රථයකට ඉස්සර කිරීමට යාමේදී සුදු ඉර කැපෙන සේ වාහනය ධාවනය වී ඇති අතර, වහා ක්‍රියාත්මක වූ රථවාහන පොලිස් නිලධාරීන් සංඥ කර අදාළ වාහනය නැවතීමට කටයුතු කර, ඔහු කළ වරද පහදාදී රුපියල් 1,100ක දඩ කොළයක් ලබාදීමට කටයුතු කර ඇත.

එහිදී දඩ කොළය ලබාගත් තරුණයා ආසන්නම තැපැල් කාර්යාලය කොහේදැයි පොලිස් නිලධාරීන්ගෙන් විමසා ඇති අතර, දෙපාර්ශ්වය අතර කෙටි කාලය තුළ ඇති වූ කතාබහේදී එම තරුණයා පවසා ඇත්තේ, තමන් ටිරාන් අලස් අමාත්‍යවරයාගේ පුතු බවයි.

මේ බව අසා කලබලයට පත් වූ බව පැවසෙන පොලිස් නිලධාරීන් දෙදෙනා ඇයි සර් කලින් ඒ බව නොකිව්වේ' යැයි විමසා තිබෙන අතර, ඉතා නිරහංකාර සිනහවකින් පමණක් එම තරුණයා ඊට පිළිතුරු ලබාදී ඇත.

අනතුරුව එක් පොලිස් නිලධාරියෙකු ඊට අදාළ මුදල් ලබාගෙන තැපැල් කාර්යාලයට ගොස් දඩය ගෙවා එම රිසිට්පත සහ රියදුරු බලපත්‍රය මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතාගේ පුතු වෙත ලබාදීමට කටයුතු කිරීමෙන් අනතුරුව ඔහු ස්තුති පූර්වකව එය භාරගෙන එතනින් නික්ම ගොස් ඇත.

මෙම සිද්ධිය ගලගෙදර පොලීසියේ ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක එන්.ඩී. හෙට්ටිආරච්චි මහතාද සනාථ කළේය.

# දොම්පේ රෝහලේ රසායනාගාර සේවක හිඟයට ගම්පහ රෝහලේ රසායනාගාර සේවකයෙකු දින 3ක් දොම්පේ රෝහලට

● එච්.අයි. තුෂාර

දොම්පේ රෝහලේ රසායනාගාර කාර්යමණ්ඩල හිඟයට විසඳුමක් ලෙස සතියේ සඳුදා, බදාදා සහ සිකුරාදා යන දින තුන සඳහා ගම්පහ දිස්ත්‍රික් මහා රෝහලේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර ශිල්පි නිලධාරියෙකු දොම්පේ රෝහලට සහන සේවයේ යොදවා තිබේ.

සතියේ අනෙකුත් දිනවල කිරිබත්ගොඩ මූලික රෝහලේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර ශිල්පි නිලධාරියෙකු යොදවා තිබෙන බවද ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කරයි.

ඉහත නිලධාරීන් සේවයේ නොමැති අවස්ථාවල සාම්පල් කළමනාකරණය කර ගනිමින් ගම්පහ දිස්ත්‍රික් රෝහලට හෝ කිරිබත්ගොඩ මූලික රෝහලට යොමුකර වාර්තා ලබා ගැනීමට අවස්ථාව සලසාදී තිබේ. දොම්පේ රෝහලට අනුයුක්ත රසායනාගාර ශිල්පි නිලධාරී සංඛ්‍යාව දෙකක් වන නමුත් සේවය කරමින් සිටින්නේ, එක් නිලධාරිනියක වන අතර, එම නිලධාරිනිය ජූලි මස 14වැනිදා සිට ප්‍රසූති නිවාඩු ලබාගෙන තිබෙන බවත්, එම නිලධාරිනිය නැවත සේවයට වාර්තා කරනතුරු මෙම තීරණය ගෙන තිබෙන බවත් එම කාර්යාලය සඳහන් කරයි.

දොම්පේ රෝහලෙහි රසායනාගාර 'කාර්යමණ්ඩලය නොමැති වීමෙන් රෝගීන් පීඩාවට' මැයෙන් සැප්තැම්බර් 11වැනිදා පළ වූ ප්‍රවෘත්තිය සම්බන්යෙන් ජනාධිපති මාධ්‍ය අංශය හරහා සිදුකළ සොයා බැලීමකට අනුව මෙම තීරණ ගෙන තිබේ.

# සංචාරක නිකේතනයක් තුළ නිධානයක් ගැනීමට තැත්කළ හිමිකරු ඇතුළු 9ක් දැලේ

● කල්පිටියකුමාරි - කොට්ටහච්චි

කල්පිටියේ තේනා වාඩිය ප්‍රධාන පෙළේ සංචාරක නිකේතනයක නිධානයක් ගැනීමට යාතිකා කරමින් සිටි නිකේතනයේ හිමිකරු ඇතුළු නවදෙනෙකු ඊයේ (04දා) කල්පිටිය පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

යකැදුරා දුම්මලසූරිය පදිංචිකරුවෙකු වන අතර ඔහුගේ සහායකයන් වශයෙන් තවත් හතර දෙනෙකු ද, සංචාරක නිකේතනයේ හිමිකරු ඇතුළු කල්පිටියේ පදිංචිකරුවන් සිව්දෙනෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

සැකකරුවන් විසින් අදාළ කැණීමට යොදාගත් උපකරණ තොගයක්ද පොලිස් භාරයට ගනු ලැබ තිබේ. මොවුන්ව විසින් මීටදින හතරකට පමණ පෙර සිට අදාළ කැණීමට සිදු කර ඇති බවට පරීක්ෂණවලදී අනාවරණය වී ඇත. කල්පිටිය පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

